12 ශ්‍රේණිය
22.09.2019

සියලුම හිමිකම් ඇවිරිණි / All rights reserved

# ගිණුම්කරණය / Accounting I

| 33 | E | I |
|---|---|---|

## De Mazenod College Kandana

Index No : ..................................................... Two Hours

Name : ....................................................................................................................

1) මූල්‍ය ගිණුම්කරණයේ මූලික අරමුණ කුමක්ද?

i. ව්‍යාපාරයේ කළමණාකරුවන්ට අවශ්‍ය තීරණ ගැනීම් සඳහා තොරතුරු සැපයීම

ii. ආදායම් බදු අයකිරීම සඳහා රජයට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම

iii. විගණකවරුන්ට විගණන මතය පළ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම.

iv. මූල්‍ය ප්‍රකාශණ කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ව්‍යාපාර තීරණ ගැනීම් සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම

v. මහ බැංකුවට අවශ්‍ය මූල්‍ය තොරතුරු සම්පාදනය (............)

2) ව්‍යාපාරයක සේවකයන්ගේ කාර්යක්ෂමතාවය මූල්‍ය ප්‍රකාශණ තුල ඉදිරිපත් නොකිරීමට අදාළ ගිණුම්කරණ සංකල්පය කුමක්ද?

i. ව්‍යාපාර ඒකකය

ii. ආරක්ෂණ සංකල්පය

iii. ඓතිහාසික පිරිවැය

iv. ප්‍රමාණාත්මකභාවය

v. මූල්‍ය මිනුම් සංකල්පය (............)

3) කමල් විසින් ඔහුගේ ව්‍යාපාරයේ මාසික ණය වාරිකය වූ රු.100,000 ඔහුගේ පෞද්ගලික මුදලින් ගෙවන ලද අතර එහි ඇතුලත් පොළිය රු.25000කි.
ඉහත ගණුදෙනුව ගැලපීමට අදාළ නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|---|
| i. | 0 | = | −75,000 | + | 75,000 |
| ii. | 0 | = | −100,000 | + | 100,000 |
| iii. | +75,000 | = | 0 | + | 75,000 |
| iv. | −100,000 | = | −100,000 | + | − |
| v. | −100,000 | = | −75,000 | + | −25,000 |

(............)

- පහත තොරතුරු ප්‍රශ්න අංක 04 සහ 05 සඳහා පිළිතුරු සැපයීමට භාවිතා කරන්න.

පහත තොරතුරු නාලකගේ ව්‍යාපාරයට අදාල වේ.

| | | |
|---|---|---|
| 02.03.2018 | - | රු.150000 පිරිවැය වූ තොගයක් උදාරගෙන් ණයට ගැනීම |
| 10.03.2018 | - | පිරිවැය රු.30000 වූ තොගයක් උදාර වෙත ආපසු යැවීම |
| 25.03.2018 | - | පිරිවැය රු.100000 වූ තොගයක් 160000 කට ණයට විකිණීම |
| 25.03.2018 | - | විකුණුම් කොමිස් ගෙව්වා රු.10000 |
| 03.04.2018 | - | උදාරට ගෙවීමට ඉතිරි මුලු මුදල ගෙවා නිදහස් කිරීම (............) |

Learning Resource Center
R
De Mazenod College
Kandana

4) ඉහත තොරතුරු වලට අදාලව නාලකගේ ව්‍යාපාරයේ ණයගැති පාලන ගිණුමේ සහ ණයහිමි පාලන ගිණුමේ වැඩිවීම කොපමණද?

| | ණය හිමි පාලන | ණය ගැති පාලන ගිණුම |
|---|---|---|
| i. | 20000 | 150000 |
| ii. | 20000 | 160000 |
| iii. | 120000 | 150000 |
| iv. | 120000 | 160000 |
| v. | 150000 | 160000 |

(...........)

5) නාලකගේ ව්‍යාපාරයේ උදාර සමග සිදුවූ ගණුදෙනු වලට අදාලව මූලාශ්‍ර ලේඛණ වන්නේ?

i. ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වව්චරය
ii. ඉන්වොයිසිය, බැරපත, ලදුපත
iii. ඉන්වොයිසිය, බැරපත, ජර්නල් වව්චරය
iv. ඉන්වොයිසිය, හරපත, ජර්නල් වව්චරය
v. ඉන්වොයිසිය, ජර්නල් වව්චරය, ගෙවීම් වව්චරය (...........)

6) ව්‍යාපාරයක නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා ලාභය ගණනය කිරීමට අදාල සමීකරණය වන්නේ,

i. අවසාන හිමිකම + ගැනිලි + අමතර ප්‍රාග්ධනය – ආරම්භක හිමිකම
ii. අවසාන හිමිකම + ගැනිලි – අමතර ප්‍රාග්ධනය – ආරම්භක හිමිකම
iii. අවසාන හිමිකම – ගැනිලි + අමතර ප්‍රාග්ධනය – ආරම්භක හිමිකම
iv. අවසාන හිමිකම – ගැනිලි + අමතර ප්‍රාග්ධනය + ආරම්භක හිමිකම
v. අවසාන හිමිකම + ගැනිලි – අමතර ප්‍රාග්ධනය + ආරම්භක හිමිකම (...........)

7) පොදු ලෙජරයට අදාලව පහත කුමණ ප්‍රකාශණය නිවැරදි වේද?

A. ව්‍යාපාරයක ගණුදෙනු මුල් වරට පොදු ලෙජරයේ වාර්ථා කරයි.

B. ලෙජර ගිණුම් සමූහයක් ද්විත්ව සටහන් න්‍යාය මත පවත්වාගෙන යන ස්ථානය පොදු ලෙජරයයි

C. ව්‍යාපාරික ගණුදෙනු මුල්වරට උපයෝගී පොත් තුල වාර්ථා කිරීමෙන් පසුව පොදු ලෙජරයට පිටපත් කරයි.

D. ගිණුම් කාල පරිච්ඡේදය අවසානයේ සියලු ලෙජර් ගිණුම් සඳහා පියවීමේ සටහන් වාර්ථා කරයි.

i. $A$ පමණි
ii. $A$ සහ $B$ පමණි
iii. $A$ සහ $C$ පමණි
iv. $B$ සහ $C$ පමණි
v. $A, B, C$ සහ $D$ යන සියල්ලම (...........)

8) ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කුමන ප්‍රකාශණය නිවැරදි වේද?

i. සුලු මුදල් ගෙවීම් ජර්නලය ලෙජර ගිණුමක් ලෙස ක්‍රියාකරයි
ii. සියලුම මූලාශ්‍ර ලේඛණ ව්‍යාපාර ගණකාධිකාරී විසින් පිළියෙල කරයි

22-07-2019

iii. ගැණුම් ජර්නලය තුල සියලු වත්කම් ණයට ගැණුම් වාර්ථා කරයි.

iv. ශේෂ පිරික්සුම තුලනය වීම මත ව්‍යාපාරයේ ගණුදෙණු වලට නිවැරදිතාවය තහවුරු කළ හැකිය.

v. ණයගැති පාලණ ගිණුම තුල ණයට විකුණුම් හා සම්බන්ධ ගණුදෙණුවල සාරාංශයක් (එකතුන්) වාර්ථා කරයි. (............)

9) පහත තොරතුරු ගයාත්‍රී පොදු සමාගමට අදාල වේ.

| | 2018/03/31 දිනට | 2017/03/31 දිනට |
|---|---|---|
| ගෙවිය යුතු කුලී | - | 60000 |
| ගෙවිය යුතු අලුත්වැඩියා වියදම් | 40000 | 80000 |

2016/4/1 දින ව්‍යාපාරය මාසිකව රු.30000 කට ව්‍යාපාරික ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගන්නා ලදී.

කුලී සහ අලුත්වැඩියා වියදම් 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය තුල පහත පරිදි මුදලින් ගෙවීය.

| | |
|---|---|
| කුලී | 480,000 |
| අලුත්වැඩියා | 380,000 |

2018.03.31 දිනට ඉදිරියට ගෙවූ කුලී සහ වර්ෂයට අදාල අලුත්වැඩියා වියදම වන්නේ ?

| | ඉදිරියට ගෙවූ කුලී | අලුත්වැඩියා වියදම |
|---|---|---|
| i. | 60000 | 340000 |
| ii. | 60000 | 420000 |
| iii. | 120000 | 340000 |
| iv. | 480000 | 420000 |
| v. | 480000 | 300000 |

Learning Resource Centre R De Mazenod College Kandana

(............)

10) කුමාරිගේ ව්‍යාපාරයේ 2018.03.31 දිනට ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ෂණයන් වලදී පහත වැරදි සිදුවී ඇති බව අනාවරණය විය.

A. විදුලි වියදම් ගෙවීම් රු.100000 මුදල් ගිණුමේ පමණක් වාර්ථා කර ඇත.

B. ගැනුම් ජනලය රු 20000 වැඩිපුර එකතු කර තිබීම

C. ණය ගැතියෙකුගෙන් ලද රු30000 මුදල ණයහිමි පාලන ගිණුමේ ණය හිමි ගෙවීමක් ලෙස වාර්ථාකර තිබීම

D. රු.40000 විකුණුම් ඉන්වොයිසියක් ණයගැති උප ලෙජරයේ අදාල ණයගැති ගිණුමේ පමණක් වාර්ථා කර තිබීම.

ඉහත කුමන වැරදි අවිනිශ්චිත ගිණුමක් ඇති කිරීමට හේතුවේද?

i. $A$ හා $B$ පමණි

ii. $B$ හා $D$ පමණි

iii. $A, B$ හා $C$ පමණි

iv. $B, C$ හා $D$ පමණි

v. $A, B, C$ සහ $D$ සියල්ලම

(............)

11) *VAT* බදු සඳහා ලියාපදිංචි ව්‍යාපාරයක් වූ කමල්ගේ ව්‍යාපාරය 2017/04/01 දින රු:4,140,000 කට යන්ත්‍රයක් මිලදී ගත් අතර එහි ඇතුලත් *VAT* බදු ප්‍රමාණය 540,000 ක් විය. තවද යන්ත්‍රයේ ප්‍රයෝජනවත් ආයුකාලය වර්ශ 5 ක් වූ අතර. එලදායි ජීවිත කාලය අවසානයේ කිසිදු සුන්බුන් අගයක් නොපැවතුනි.

2018.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ අගය වන්නේ?

i. රු:2,448,000
ii. රු:2,880,000
iii. රු:3,312,000
iv. රු:3,600,000
v. රු:4,140,000

(............)

12) වෙළඳ ව්‍යාපාරයක ආදායම් ප්‍රකාෂණයෙන් පහත තොරතුරු 2018.03.31 දිනෙන් අවසන් වර්ෂයට උපුටා ගන්නා ලදී.

| විස්තරය | රු'000 |
|---|---|
| විකුණුම් | 2000 |
| ආයෝජන ආදායම් | 250 |
| දේ.පි.උ විකිණීමේ ලාභ | 150 |
| පොලි වියදම | 300 |
| මෙහෙයුම් වියදම් | 500 |
| විකුණුම් පිරිවැය | 1200 |
| ගැනිලි - භාණ්ඩ | 200 |

2018.3.31 දිනෙන් අවසන් වර්ශය සඳහා හඳුනාගත යුතු මුළු ආදායම හා මුළු වියදම වන්නේ,

| | මුළු ආදායම (රු'000) | මුළු වියදම (රු'000) |
|---|---|---|
| i. | 1200 | 800 |
| ii. | 1200 | 1000 |
| iii. | 2250 | 2000 |
| iv. | 2400 | 2000 |
| v. | 2400 | 2200 |

(............)

13) පහත දෑ අතුරෙන් ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශණ කට්ටලයක් තුල ඇති සංරචකයන් හඳුන්වන්න.

A. සම්මුච්චිත අරමුදල් ගිණුම
B. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
C. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
D. සාමාජික ගාස්තු ගිණුම
E. ආදායම් හා වියදම් ගිණුම

i. *A* සහ *D* පමණි
ii. *B* සහ *C* පමණි
iii. *A*, *D* සහ *E* පමණි
iv. *B*, *C* සහ *E* පමණි
v. *A*, *B* සහ *E* පමණි

(............)

22-09-2019

- පහත තොරතුරු ප්‍රශ්ණ අංක 14 සහ 15 සඳහා පිළිතුරු සැපයීමට භාවිතා කරන්න.

පහත තොරතුරු පාසලක ආදි ශිෂ්‍ය සංගමයක් හා සම්බන්ධයෙන් 2018.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල වේ.

| | වටිනාකම (රු'000) |
|---|---|
| ලද සාමාජික ගාස්තු (මෙයින් $\frac{1}{4}$ 2017.3.31 දිනෙන් අවසන් වර්ශයට අදාල වේ.) | 360 |
| ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා ලද පරිත්‍යාග | 500 |
| ස්ථාවර තැම්පතුව මත උපයන ලද පොලී ආදායම | 50 |
| මුළු වියදම | 300 |

අමතර තොරතුරු,

- එක් සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව 4000 වූ අතර 2018.03.31 දිනට සාමාජිකයින් 100 දෙනෙකු ව්‍යාපාරයෙහි සිටියහ.
- ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ ලද වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 5 තුළ පරිත්‍යාග ලාභයට එරෙහිව කපා හැරීමයි.
- ස්ථාවර තැම්පතුව මත පොළී, එය කල්පිරෙන දිනය වන 2018.05.31 දිනට ලැබීමට නියමිතය
- මුළු වියදම් මුදලෙන් ගෙවා පැවතුනි.
- 2017.3.31 දිනට මුදල් ශේෂය රු.150,000 විය.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

14) 2018.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය කොපමණද?

i. රු:120,000 iv. රු:520,000
ii. රු:210,000 v. රු:650,000
iii. රු:250,000

(...........)

15) 2018.3.31 දිනෙන් අවසන් වර්ශය සඳහා මුදල් ශේෂයේ ශුද්ධ වැඩිවීම කොපමණද?

i. රු:470,000 iv. රු:610,000
ii. රු:520,000 v. රු:860,000
iii. රු:560,000

(...........)

16) 2018.3.31 දිනට අනෝමා සමාගමේ ණයගැති පාලන ගිණුමේ ශේෂය රු:460,000 වූ අතර , එදිනට ණයගැති ලෙජරයේ ශේෂ ලයිස්තුවේ එකතුව රු:450,000 විය.

පසුව කරන ලද විමර්ශනයන් වලදී පහත වෙනසට හේතුවූ කරුණු හඳුනාගන්නා ලදී.

- රු: 10000 බොල් ණය ලෙස කපාහැරීම ණයගැති පාලන ගිණුමේ වාර්ථා කර නොතිබීම
- රු: 21000 විකුණුම් ඉන්වොයිසියක් විකුණුම් ජනලය තුල රු:12000 ලෙස වාර්ථා කර තිබීම
- ණයගැතියෙකු විසින් ව්‍යාපාරයේ බැංකු ගිණුමට කෙලින්ම මුදල් තැන්පත් කිරීමක් වන රු 31000 පිළිබඳව කිසිඳු තොරතුරක් වාර්ථා කර නොතිබීම.

2018.3.31 දිනට නිවැරදි ණයගැති පාලන ශේෂය වන්නේ

i. රු:410,000
ii. රු:428,000
iii. රු:448,000
iv. රු:459,000
v. රු:490,000 (...........)

17) පහත තොරතුරු ව්‍යාපාරයක 2018 අප්‍රේල් මාසය සඳහා අදාල වේ.

| ගැනුම් | ලකුණු කළ මිල (රු:) | වෙළඳ වට්ටම ( %) | මුදල් වට්ටම (%) |
|---|---|---|---|
| ණයට | 400,000 | 5 | 5 |
| අත්පිට | 200,000 | 10 | |

අත්පත්කරගත් දින සිට දින 15 ඇතුලත ගෙවීම් කරයි නම් පමණක් මුදල් වට්ටම් සඳහා හිමිකම් කියන අතර ව්‍යාපාරය මුළු ණයට ගැනුම් වලින් 50% ප්‍රමාණයක් පමණක් දින 15 තුල නිරවුල් කිරීමට සමත් විය. ලද වට්ටම් වාර්ථා කිරීමට අදාල නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

| | ණයහිමිපාලන ගිණුම හර(රු) | ලද වට්ටම් ගිණුම බැර(රු) |
|---|---|---|
| 1 | 9500 | 9500 |
| 2 | 10000 | 10000 |
| 3 | 29500 | 29500 |
| 4 | 30000 | 30000 |
| 5 | 39500 | 39500 |

(...........)

18) පහත ප්‍රකාශණ අතුරින් කුමන ප්‍රකාෂණය හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අදාල නොවන්නේද?

A. ලාභ අලාභ හවුල්කරුවන් අතර සම සමව බෙදාගත යුතුය.
B. හවුල්කරුවන් ඔවුන්ගේ ප්‍රාග්ධන ශේෂ මත පොළී සඳහා හිමිකම් ලබයි.
C. හවුල්කරුවන් හවුල් වේතන සඳහා හිමිකම් නොකියයි.
D. ඉවත්ව යන හවුල්කරුවන්ගේ නිරවුල් නොකරන ලද ශේෂ මත පොලී ගෙවිය යුතුය.

i. $A$ සහ $B$ පමණි
ii. $B$ සහ $D$ පමණි
iii. $A, B$ සහ $D$ පමණි
iv. $A, C$ සහ $D$ පමණි
v. $B, C$ සහ $D$ පමණි (...........)

- පහත තොරතුරු නිශ්පාදන ව්‍යාපාරයකට අදාලව 2019 මාර්තු මාසය සඳහා ඉදිරිපත් කර ඇත. (ප්‍රශ්න අංක 19 සහ 20 සඳහා )

| | (රු'000) |
|---|---|
| නොනිමි තොග වැඩිවීම (ප්‍රාථමික පිරිවැයට ) | 300 |
| නිමි තොග අඩුවීම | 100 |
| පරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැය | 300 |
| සෘජු ශ්‍රමය | 200 |
| නිශ්පාදන පොදු කාර්යය | 200 |

22 . 07 . 2019

19) මාර්තු මාසය සඳහා ප්‍රාථමික පිරිවැය වන්නේ,

i. 200,000 iii. 800,000 v. 1000,000

ii. 220,000 iv. 850,000 (...........)

- පහත තොරතුරු ප්‍රශ්න අංක 20 සහ 21 සඳහා පිළිතුරු සැපයීමට භාවිත කරන්න.

2019 පෙබරවාරි සහ මාර්තු මාස වලට අදාලව චෙක් තැම්පතු සහ චෙක් නිකුත් කිරීම පහත පරිදි විය.

| විස්තරය | 2019 මාර්තු (රු.000) | 2019 පෙබරවාරි (රු.000) |
|---|---|---|
| චෙක් තැම්පතු | 1000 | 900 |
| චෙක් නිකුත් කිරීම | 750 | 600 |

පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| විස්තරය | 2019.3.31 දිනට | 2019. 2.28 දිනට |
|---|---|---|
| නිශ්කාෂණය වූ තැම්පතු | 750 | 900 |
| ගෙවීම් සඳහා ඉදිරිපත් වූ චෙක්පත් | 600 | 500 |
| බැංකුවට ලද පොලී ආදායම් | - | 50 |
| බැංකු ගාස්තු | 10 | 5 |
| මුදල් පාලන ශේෂය(පොලී ආදායම් හා බැංකු ගාස්තු වලට පෙර) | 395 | 100 |
| බැංකු ප්‍රකාෂණය අනුව ශේෂය | ? | 245 |

Learning Resource Center
R
De Mazenod College
Kandana

20) මුදල් පාලන ගිණුමේ සංශෝධිත ශේෂය වන්නේ (2018.02.28 දිනට)

i. රු:145,000 iii. රු:200,000 v. රු:345,000

ii. රු:190,000 iv. රු:290,000 (...........)

21) 2019.3.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය කොපමණද?

i. රු:245,000 iii. රු:295,000 v. රු:395,000

ii. රු:285,000 iv. රු:385,000 (...........)

22) ව්‍යාපාරයක් විසින් ලකුණුකල මිල රු: 200,000 වූ භාණ්ඩ 10% වෙළඳ වට්ටමකට යටත්ව ණය පදනම මත අත්පත්කර ගත්හ. ඉහත ගණුදෙනුව නිවැරදිව දක්වන ගිණුම්කරන සමීකරණය වන්නේ,

| | වත්කම් | වගකීම් | හිමිකම් |
|---|---|---|---|
| i. | 180,000 වැඩි වේ | 180,000 වැඩි වේ | - |
| ii. | 200,000 වැඩි වේ | 200,000 වැඩි වේ | - |
| iii. | 180,000 වැඩි වේ | 200,000 වැඩි වේ | 20000 අඩු වේ |
| iv. | 200,000 වැඩි වේ | 180,000 වැඩි වේ | 20000 වැඩි වේ |
| v. | 200,000 වැඩි වේ | 220,000 වැඩි වේ | 20000 අඩු වේ (...........) |

23) 2019.03.31 දිනට ව්‍යාපාරයක පැවති මුළු තොගය ගංවතුර හේතුවෙන් විනාශ විය.

පහත තොරතුරු 2019.3.31 දිනට අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇත.

| | රු'000 |
|---|---|
| 2018.4.1 දිනට තොගය | 1500 |
| ගැනුම් | 3500 |
| ආපසු යැවුම් | 500 |
| විකුණුම් | 4800 |
| විකුණුම් වියදම් | 600 |

ව්‍යාපාරය විසින් පිරිවැය මත 20% ලාභයක් සහිතව භාණ්ඩ විකුණන ලදී.

2019.3.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හානි වූ තොගයේ පිරිවැය වන්නේ,

i. 500,000 iii. 750,000 v. 1,500,000

ii. 600,000 iv. 1,160,000 (............)

24) මූල්‍ය තත්ව ප්‍රකාශණය තුල ණයගැතියන් හා ණයහිමියන් ඉදිරිපත් කිරීම සඳහා වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

i. උපචිත iii. අඛණ්ඩ පැවැත්ම v. ප්‍රමාණාත්මක

ii. ආරක්ෂණ iv. ගැලපුම් (............)

- ප්‍රශ්න අංක 26,27, හා 28, සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

මංගල උත්සව ශාලා කුලියට දෙන ව්‍යාපාරයකට අදාලව 2019 අප්‍රේල් මාසය සඳහා පහත තොරතුරු අදාල වේ.

එක් වරකට කුලිය රු:400, 000 වන අතර එයින් 25% ක් අත්තිකාරමක් වෙන් කරන අවස්ථාවේද ඉතිරි මුළු මුදල උත්සවයෙන් පසු සතියක් ඇතුලත පියවිය යුතුය.

| දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| 2019.4.2 | 2019.3.28 දින පැවැත්වූ උත්සවයෙහි ඉතිරි මුදල් ලැබීම | 300,000 |
| 2019.4.5 | 2019.4.27 පැවැත්වීමට නියමිත උත්සවයේ අත්තිකාරම් ලැබීම | 100,000 |
| 2019.4.15 | 2019.5.10 පැවැත්වීමට නියමිත උත්සවයේ අත්තිකාරම් ලැබීම | 100,000 |
| 2019.4.30 | 2019 අප්‍රේල් මාසය සඳහා දැරූ මෙහෙයුම් වියදම | 330,000 |

25) 2019 අප්‍රේල් මාසය සඳහා මුළු ආදායම.

i. 200,000 iii. 500,000 v. 800,000

ii. 400,000 iv. 700,000 (............)

26) 2019 අප්‍රේල් මාසය සඳහා ලාභය හෝ අලාභය.

i. (130,000) iii. 170,000 v. 470,000

ii. 70,000 iv. 370,000 (............)

27) 2019.4.30 දිනට ලැබිය යුතු ආදායම.

i. 600,000 iii. 650,000 v. 660,000

ii. 300,000 iv. 370,000 (............)

22-07-2019

28) ව්‍යාපාරයක කෙටුම්පත් ලාභය ගණනය කල පසු පහත වැරදි අනාවරණය විය.

i. ණය ගැතියන්ගෙන් ලද රු:18500 ක මුදල 15800 ලෙස ණය ගැති පාලන ගිණුමෙහි වාර්ථා කර ඇත

ii. රු.25000ක ණයට විකුණුම, විකුණුම් ගිණුමෙහි රු.2500 ලෙස වාර්ථා කර තිබීම

iii. ආපසු එවුම් රු.3000 විකුණුම් ගිණුමට හර කර තිබීම

Learning Resource Centre R De Mazenod College Kandana

ඉහත වැරදි හේතුවෙන් ව්‍යාපාරයේ ලාභයේ අඩුවීම කොපමණද?

i. රු.185000 iii. රු.25200 v. රු.28200

ii. රු.22500 iv. රු.25500 (............)

29) ව්‍යාපාරයක සුලු මුදල් අග්‍රිමය රු.10000 වූ අතර 2019 මාර්තු මාසය තුල පහත වියදම් දරණ ලදී.

| | |
|---|---|
| ගමන් වියදම් | 5000 |
| තැපැල් වියදම් | 2000 |
| පිරිසිදු කිරීම් | 1000 |

2019 අප්‍රේල් මාසයේ සිට අග්‍රිමය රු.2000 කින් වැඩි කිරීමට තීරණය විය. 2019/4/1 දිනට ප්‍රතිපූර්ණය කල යුතු මුදල වන්නේ?

i. රු.12000 iii. රු.2000 v. ඉහත කිසිවක් නොවේ

ii. රු.8000 iv. රු.10000 (............)

30) ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමයෙහි වටිනාකම විය යුත්තේ,

i. රු.50000 ii. රු.5000 iii. රු.10000 iv. රු.25000

v. එය ව්‍යාපාරය විසින් තීරණය කරයි (............)

- **ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා කෙටි පිළිතුරු සපයන්න**

31) පහත තොරතුරු සඳහා වඩාත් උනන්දුවක් දක්වන පාර්ෂවය සඳහන් කරන්න.

1) රජය 2) ආයෝජකයින් 3) ණයකරුවන් 4) කළමණාකරුවන්

| තොරතුරු | පාර්ශවය |
|---|---|
| A. ව්‍යාපාරයේ දිගුකාලීන ණය ගෙවීමේ හැකියාව | ............................................ |
| B. යෙදවූ ප්‍රාග්ධනය මත උපයන ලද ලාභදායීත්වය | ............................................ |
| C. නිෂ්පාදිතයන්හි පිරිවැය | ............................................ |
| D. ගෙවූ බදු සම්බන්ධ තොරතුරු | ............................................ |

32) පහත තොරතුරු වලට අදාළව මූල්‍ය ගිණුම්කරණයේ හා කළමණාකරණ ගිනුම්කරණයේ වෙනස්කම් දක්වන්න.

| | මූල්‍ය ගිනුම්කරණය | කළමණාකරණ ගිණුම්කරණය |
|---|---|---|
| A. භාවිතා කරන පාර්ශව | .................................... | ........................................ |
| B. භාවිතා කරන වාර ගණන | .................................... | ........................................ |
| C. නීතිමය අවශ්‍යතාවය | .................................... | ........................................ |
| D. වාර්තා කරන තොරතුරු | | |

ස්වභාවය ..................................... ...........................................

- ප්‍රශ්න අංක 33,34 සහ 35 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

පහත තොරතුරු අනුර පොදු සමාගමට අදාළව 2019 මාර්තු මාසය සඳහා අදාල වේ.

1) අයිතිකරු විසින් රු. 400,000 ව්‍යාපාරයට යෙදවීම.

2) ණයට ගැණුම් රු.2,000,000

3) පරිත්‍යාග වියදම් රු.100,000

ප්‍රචාරන වියදම් රු.50,000 දරූ අතර, එය 2019 මැයි මාසයේදී ගෙවීමට නියමිතය.

33) ඉහත එක් එක් ප්‍රකාශණයෙහි බලපෑම දක්වන්න.

| බලපෑම | ගනුදෙනු අංකය |
|---|---|
| A. වත්කම් අඩුවීම හා හිමිකම් අඩුවීම | ..................................................... |
| B. වගකීම් වැඩිවීම හා හිමිකම් අඩුවීම | ..................................................... |
| C. වත්කම් වැඩිවීම හා හිමිකම් වැඩිවීම | ..................................................... |
| D. වත්කම් වැඩිවීම් හා වගකීම් වැඩිවීම | ..................................................... |

34) ඉහත එක් එක් ගණුදෙනුවට අදාළ උපයෝගී පොත සඳහන් කරන්න.

| ගනුණුව | මූලික පොත |
|---|---|
| 1 | ..................................................... |
| 2 | ..................................................... |
| 3 | ..................................................... |
| 4 | ..................................................... |

35) ඉහත ගණුදෙණුවලින් ගිනුම්කරණ මූලිකාංගයන්ට ඇති බලපෑම (√) සලකුණ යොදා දක්වන්න.

| ගණුදෙණුව | වත්කම් | වගකීම් | හිමිකම් | ආදායම් | වියදම් |
|---|---|---|---|---|---|
| 1 | ................ | ................ | ................ | ................ | ................ |
| 2 | ................ | ................ | ................ | ................ | ................ |
| 3 | ................ | ................ | ................ | ................ | ................ |
| 4 | ................ | ................ | ................ | ................ | ................ |

36) 2018/04/01 දින සමන්ගේ ව්‍යාපාරය පිරිවැය රු. 100,000 වු තොගයක් ණයට ගත් අතර එදිනම එම තොගය රු. 120,000 කට විකුනන ලද අතර (අත්පිට), රු. 5000 ක විකුණුම් වියදමක් මුදලින් ගෙවන ලදී.

ඉහත ගණුදෙණුවෙන් ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම දක්වන්න.

වත්කම් .............................. = වගකීම් .............................. + හිමිකම් ..............................

- ප්‍රශ්න අංක 37 සහ 38 සඳහා පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.

22-07-2019

2018/04/01 දින කමල් විසින් රු. 1,000,000 ප්‍රාග්ධනය ලෙස යොදා ව්‍යාපාරයක් ආරම්භ කල අතර එම ආරම්භක ආයෝජනයෙන් 90% වැයකර තොගයක් මිලදී ගනු ලැබේ. තවද එම තොගය පිරිවැය මත 30% ලාභයක් සහිතව විකුනන ලදී.

2018.03.31 දිනට ව්‍යාපාරයේ ශුද්ධ වත්කම රු.1,200,000 වූ අතර කාලපරිච්ඡේදය තුල අමතර ප්‍රාග්ධන යෙදවීමක් හෝ ගැනිලි සිදු කිරීමක් නොතිබුණි.

37) 2018/03/31 දිනෙන් අවසන් කාර්තුව සඳහා ලාභය / අලාභය වන්නේ,

..............................................................................................................................

38) 2018/03/31 දිනෙන් අවසන් කාර්තුව සඳහා මෙහෙයුම් වියදම වන්නේ,

..............................................................................................................................

- ප්‍රශ්න අංක 39,40 සඳහා පිලිතුරු සැපයීමට පහත තොරතුරු භාවිතා කරන්න.
  2019/03/31 දිනට මුදල් පාලන ගිණුමේ ශේෂය රු.450,000 වූ අතර එය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකග නොවීය. පහත තොරතුරු පසුව අනාවරණය විය.

i. ණයගැතියෙකු විසින් රු. 80,000 ක චෙක් පතක් කෙලින්ම බැංකුවේ තැන්පත් කර තිබීම.

ii. බැංකුව විසින් ගෙවූ ස්ථාවර නියෝග 40,000

iii. තැන්පත් කරන ලද රු.60,000 ක චෙක්පතක් අගරු වීම

iv. තැන්පත් කරන ලද රු.20,000 ක චෙක්පතක් නිශ්කාෂණය නොවීම

v. නිකුත් කරන ලද රු. 30,000ක චෙක්පතක් ගෙවීම සඳහා ඉදිරිපත් නොවීම.

39) 2019/03/31 දිනට සංශෝධිත බැංකු ශේෂය රු. ..............................................................................

40) 2019/03/31 දිනට බැංකු ප්‍රකාශණය අනුව ශේෂය රු. ...................................................................

41) පහත දෑ කුමන ගිණුම්කරණ මූලිකාංගයට අදාළ වන්නේ දැයි සඳහන් කරන්න.

| අයිතමය | මූලිකාංගය |
|---|---|
| 1. උපචිත වේතන | ................................................ |
| 2. ලැබිය යුතු පොලී ආදායම | ................................................ |
| 3. ගැනිලි | ................................................ |
| 4. ඉදිරියට ගෙවූ විදුලිය | ................................................ |

42) නිෂ්පාදන ව්‍යාපාරයක පහත අවස්ථාවන්ට අදාළ ගිණුම්කරන සංකල්පය දක්වන්න.

| | සංකල්පය |
|---|---|
| 1. වර්ෂ අවසාන තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධිය අගය යන දෙකෙන් අඩු අගයට වාර්තා කිරීම | ................................................ |
| 2. සෑම ගිනුම් කාලච්චේදයකටම අදාළව | |
| 3. නිෂ්පාදන ගිණුමක් පිලියෙල කිරීම | ................................................ |

43) ව්‍යාපාරයක පොදු ජ'නලය තුල වාර්ථා වන ගනුදෙනු වර්ග 02ක් සඳහන් කරන්න.

i. ..............................................................................................................................

ii. ..........................................................................................................................

44) වගකීමක ලක්ෂණ 03ක් සඳහන් කරන්න.

i. ..........................................................................................................................

ii. ..........................................................................................................................

iii. ..........................................................................................................................

45) වත්කමක හඳුනා ගැනීමේ ලක්ෂණ සඳහන් කරන්න.

i. ..........................................................................................................................

ii. ..........................................................................................................................

46) නිෂ්පාදන ව්‍යාපාරික පහත තොග සෘජු හෝ වක්‍ර ලෙස හඳුනා ගන්න.

i. සකසන ලද සම් නිෂ්පාදන ..........................................................

ii. නිෂ්පාදන කළමණාකරණ වේතන ..........................................................

iii. යන්ත්‍ර ක්‍රියාකරු වැටුප ..........................................................

iv. යන්ත්‍ර ක්ෂය වියදම ..........................................................

- පහත තොරතුරු ප්‍රශ්න අංක 47,48 හා 49 සඳහා පිළිතුරු සැපයීමට භාවිතා කරන්න.

මාර්තු මාසයේ කාර්යාල වියදම් රු 60,000 ගෙවීම කාර්යාල උපකරණ ගිණුමට රු.600,000 ලෙස වාර්තා කර තිබුණි. තවද ව්‍යාපාරය තම කාර්යාල උපකරණ මත වාර්ෂිකව 10% සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි. (ව්‍යාපාරය නියමිත පරිදි මාසය සඳහා ක්ෂය වීම් වාර්තා කර ඇත.)

47) ඉහත ගිණුම්කරන වරද හේතුවෙන් මාර්තු මාසයේ ලාභයට සිදු වූ බලපෑම වන්නේ,

..........................................................................................................................

48) ඉහත වරද හේතුවෙන් ව්‍යාපාරයේ දේපල පිරියත උපකරණ වල ධාරණ අගයට සිදු වූ බලපෑම වන්නේ,

..........................................................................................................................

49) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල සටහන් වන්නේ,

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

50) ව්‍යාපාරයක සුළු මුදල් අග්‍රිමය රු. 10,000 වූ අතර කාලපරිච්ඡේදය අවසානයේ සුළු මුදල් භාරකරු විසින් රු. 8000 ක ශේෂයන් ප්‍රතිපූර්ණය කිරීමට ඉල්ලුම් කළේය.

a) කාලච්ඡේදයේ සුළු මුදල් වියදම වන්නේ ..........................................................

b) සුලු මුදල් ආග්‍රිමය ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය ජ'නල සටහන

..........................................................................................................................

..........................................................................................................................

සියලුම හිමිකම් ඇවිරිණි]
*All Right Reserved]*

Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Accounting Account

ද මැසනොද් විදුහල, කඳාන
De Mazonod Collage, Kandana

## අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ
## දෙවන වාර පරීක්ෂණය - 2019 ජූලි 21

| ගිණුම්කරණය II<br>*Accounting II* | 13 ශ්‍රේණිය<br>*Grade 13* | කාලය<br>පැය 03 |
|---|---|---|

* **පළමු හා දෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

(01) ජයන්ත භාණ්ඩ නිෂ්පාදනය කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. 2019-03-31 න් අවසන් වර්ෂයට අදාලව පහත ශේෂයන් සපයා ඇත.

| | හර | බැර |
|---|---|---|
| 2018-04-01 තොගය | | |
| අමුද්‍රව්‍ය තොගය | 40 000 | |
| නොනිමි තොගය (කම්හල් පිරිවැයට) | 20 000 | |
| නිමි තොගය | 50 000 | |
| අමුද්‍රව්‍ය ගැණුම් | 300 000 | |
| වැටුප් හා වේතන | 200 000 | |
| විදුලි හා රක්ෂන ගාස්තු | 40 000 | |
| යන්ත්‍ර අලුත්වැඩියාව | 10 000 | |
| ප්‍රචාරණ ගාස්තු | 25 000 | |
| ගෙවූ ගොඩනැගිලි කුලිය | 60 000 | |
| ණය පොලිය | 10 000 | |
| ගැනිලි | 90 000 | |
| බැංකු ශේෂය | 50 000 | |
| කාර්යාල උපකරණ (පිරිවැය) | 200 000 | |
| යන්ත්‍ර පිරිවැය (පිරිවැය) | 150 000 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | 80 000 | |
| 2018-04-01 වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරන වෙන් කිරීම | | 10 000 |
| 2018-04-01 කාර්යාල උපකරණ ක්ෂය වෙන් කිරීම | | 45 000 |
| 2018-04-01 යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම | | 48 000 |
| 18% බැංකු ණය | | 100 000 |
| විකුණුම් | | 800 000 |
| ප්‍රාග්ධනය | | 232 000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 90 000 |
| | 1 325 000 | 1 325 000 |

Learning Resource Center
R
De Mazonod College
Kandana

පහත කරුණු ගැලපීමට ඇත.

01. 2019-03-31 දිනට ඉතිරි තොගය

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොගය | 45 000 |
| නොනිමි තොගය (කම්හල් පිරිවැය) | 25 000 |
| නිමි තොගය | 70 000 |

02. වර්ෂයේ වැටුප් හා වේතන විශ්ලේෂණය පහත දක්වේ.

| | |
|---|---|
| කම්හල් සෘජු වැටුප් | 80 000 |
| කම්හල් කළමනාකරණ වේතන | 40 000 |
| විකුණුම් සේවක වේතනය | 30 000 |
| කාර්යාල සේවක වේතනය | 50 000 |
| | 200 000 |

03. ක්ෂය කල හැකි වත්කම් පිළිබඳ විස්තර පහත දක්වේ

| | ජීව කාලය | සුන් බුන් අගය |
|---|---|---|
| කාර්යාල උපකරණ | අවුරුදු 10 | 50 000 |
| යන්ත්‍ර | අවුරුදු 05 | 30 000 |

04. උපචිත විදුලි ගාස්තුව රු 5000 කි. ඉදිරියට ගෙවා ඇති රක්ෂණ ගාස්තුව රු 15 000 කි. මුලු විදුලි හා රක්ෂණ ගාස්තු වියදමෙන් 1/3 කම්හලට අයත් අතර ඉතිරිය කාර්යාලයට අයත් වේ.

05. ගොඩනැගිලි මාසික කුලිය රු 5000 කි. ගොඩනැගිල්ල 50% ක් කම්හල භාවිතා කරන අතර ඉතිරිය කාර්යාල කටයුතු වෙනුවෙන් භාවිතා කරයි.

06. වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානි කරන අලාභ වෙන් කිරීම 10% කි.

07. බැංකු ණය සඳහා වාර්ෂික පොලිය 18% කි. බැංකු ණයෙන් 1/4 ලබන වර්ෂයේදී ගෙවීමට අපේක්ෂා කරයි.

08. වර්ෂය තුලදී රු 15 000 ක් වටිනා අමුද්‍රව්‍ය තොගයේ හානි වී ඇතත් පොත් වල ගලපා ඇත.

09. ලබන වර්ෂයේ විකුණුම් වෙනුවෙන් ලද රු 50 000 ක් විකුණුම් අත්තිකාරම් මුදලක් විකුණුම් ගිණුමට බැර කර ඇත.

10. බැංකු ප්‍රකාශණයේ ශේෂය සමග ව්‍යාපාරයේ බැංකු ශේෂය අසමාන වූ අතර පසුව පහත කරුණු අනාවරණය වී ඇත.

- ණයහිමියකු නිකුත් කල රු 20 000 ක චෙක් පතක් බැංකුවට තවම ඉදිරිපත් කර මුදල් ලබාගෙන නැත.
- බැංකුව විසින් අයකර ඇති බැංකු ගාස්තු 10 000 පිළිබඳව ව්‍යාපාරය බැංකු ගිණුමේ සටහන් කර නැත.

**අවශ්‍යවන්නේ,**

2019-03-31 ක් අවසන් වර්ෂයට අදාලව

1. නිෂ්පාදන ප්‍රකාශණය
2. ආදායම් ප්‍රකාශණය
3. 2019-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණ

(කාලය විනාඩි 36 ලකුණු 20)

02 (අ) තාරක වෙළඳ ආයතනයේ 2019-03-31 ක් අවසන් වර්ෂයේ කෙටුම්පත් අලාභය රු 80 000 ක් විය පසුව පහත වැරදි හඳුනාගෙන ඇත.

1. රු 20 000 ක ගැණුම් ඉන්වොයිසියක් රු 2000 ක් ලෙස ආපසු එවුම් ජ'නලයේ සටහන් කර තිබීම වෙළඳ ලැබිය යුතු දෑ මත 20% හානි කරන අලාභ වෙන් කිරීමක් සිදු කර ඇත.
2. ණයහිමියෙකුට රු 15 000 ක භාණ්ඩ ආපසු යැවුමක් නිවැරදිව ණයහිමි පාලන ගිණුමට හර කර ඇතත් ආපසු යැවුම් ගිණුමට බැර කර නොතිබීම
3. 2018-10-01 රු 40 000 ක කාර්යාල වියදමක් ගෙවීම මුදල් ගිණුමට නිවැරදිව බැර කර කාර්යාල උපකරණ ගිණුමට හර කර තිබීම කාර්යාල උපකරණ වර්ෂය තුල සරල මාර්ග ක්‍රමයට 10% ක් ක්ෂය කර ඇත.
4. වර්ෂය තුල රු 15 000 ක බැංකු ණය වාරිකයක් ගෙවා ඇත. එම ගෙවූ මුළු වාරිකයට මුදල් ගිණුමට බැර කර ණය පොලී ගිණුමට හර කර තිබුණි. මෙම වාරිකය ඇතුලත් ණය පොලිය රු 5 000 කි.

5. මසකට රු 12 000 බැගින් ගොඩනැගිලි කුලී ගෙවීමට ඇත. මාස 9 ක ගොඩනැගිලි කුලී වර්ෂය තුල ගෙවා ඇතත් එම මුදල් මුදල් ගිණුමට නිවැරදිව බැර කර ලද ගොඩනැගිලි කුලී ගිණුමකටද බැර කර තිබුණි. ඒ හැර වෙනත් කිසිම සටහනක් මේ සම්බන්ධයෙන් පොත් වල වාර්තා කර නැත.

**අවශ්‍යවන්නේ,**

1. වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන් පොදු ජ'නලයක සටහන් කර දක්වීම
2. අවිනිශ්චිත ගිණුම පිළියෙල කර වැරදි නිවැරදි කිරීමට පෙර ශේෂය ලබා ගැනීම
3. ලාභ සංශෝධණ ලේඛණය පිළියෙල කර නිවැරදි ලාභය හෝ අලාභය ලබා ගැනීම (විනාඩි 18 ලකුණු 10)

(ආ) රන්දික ව්‍යාපාරයට VAT ලියාපදිංචි අංකයක් ඇති පහත තොරතුරු 2019 ජුනි මාසයට අදාල වේ. ගැණුම් සහ විකුණුම් 15% VAT ඇතුලත් වේ.

1. මුදල් ලැබීම් සාරාංශය

| | රු |
|---|---|
| අත්පිට විකුණුම් VAT සහිත | 460 000 |
| ණයගැතියන්ගෙන් ලද මුදල් | 760 000 |
| ප්‍රාග්ධනය යෙදීම | 300 000 |

2. ණයට විකුණුම් වලට අදාල විස්තර

| | |
|---|---|
| මුදල් ණයට විකුණුම් VAT සහිත | 690 000 |
| දුන් වට්ටම් | 40 000 |
| බොල් ණය කපා හැරීම | 10 000 |
| ආපසු එවුම් | 20 000 |
| අගරු වූ චෙක් | 15 000 |

3. 2019-06-01 ණයගැති පාලන ගිණුම් ශේෂය 30 000 කි.
   මුදල් පාලන ගිණුම් ශේෂය රු 50 000 කි.
4. මාසය තුල මුදල් ගෙවීම් ජ'නලයේ එකතුව රු 550 000 කි.

Learning Resource Center
R
De Mazenod College
Kandana

**අවශ්‍යවන්නේ,**

1. මුදල් ලැබීම් ජ'නලය
2. විකුනුම් ජ'නලය
3. ණයගැති පාලන ගිණුම
4. මුදල් පාලන ගිණුම (විනාඩි 9 ලකුණු 5)

(ඇ) චතුර ආයතනයේ මැයි 31 ණයහිමි පාලක ගිණුමේ ශේෂය රු 80 000 කි. එදින ණයහිමි උප ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එකතුව මේ හා සමාන නොවීය පසුව පහත වැරදි අනාවරණය වී ඇත.

1. රු 30 000 ක ගැණුම් ඉන්වොයිසියක් උප ලේජරයේ ණයහිමියාගේ පෞද්ගලික ගිණුමේ සටහන් කර ඇත්තේ රු 33 000 ක් ලෙස මෙය පොදු ලෙජරයේ නිවැරදිව සටහන් කර ඇත.
2. ආපසු යැවුම් ජනලයේ එකතුව රු 8000 ක් වැඩියෙන් එකතු කර තිබීම
3. ණයහිමියකුගෙන් ලද රු 6000 ක ලද මුදල් වට්ටමක් පිළිබඳ පොදු ලෙජරයේ හෝ ණයහිමි උපලෙජරයේ කිසිම සටහනක් තබා නැත.
4. ණයහිමි ශේෂ ලැයිස්තුව එකතු කිරීමේදී රු 10 000 ක බැර ශේෂයන් අත්හැරී තිබීම

**අවශ්‍යවන්නේ,**

1. ණයහිමි සැසඳුම් ලේඛණය පිළියෙල කර වැරදි නිවැරදි කිරීමට පෙර ණයහිමි ශේෂ ලැයිස්තුවේ එකතුව ලබා ගැනීම
2. සංශෝධණ ණයහිමි පාලන ගිණුම
3. ණයහිමි ශේෂ ලැයිස්තුවේ නිවැරදිව එකතුව (විනාඩි 9 ලකුණු 5)

(03) 2018-01-01 දින විසින් ව්‍යාපාරයක් ආරම්භ කල අතර එහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් හරහා සිදුවේ. තවද කුමාරි ව්‍යාපාරයේ කළමනාකරු ලෙස කටයුතු කරන අතර ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා සේවකයෙකුද බඳවාගෙන ඇත.

පහත ගනුදෙනු 2018 ජනවාරි මාසයට අදාලව සිදුවිය.

| නො | දිනය | චෙක්පත් අංක | ගණුදෙනුව |
|---|---|---|---|
| 01 | 01/01 | | කුමාරි මුදලින් 1 200 000 සහ රු 360 000 වටිනා යන්ත්‍ර ව්‍යාපාරයට ප්‍රාග්ධනය ලෙස යෙදවීම |
| 02 | 03/01 | 200 | රු 600 000 වටිනා තොග මුදලට ගැනීම |
| 03 | 07/01 | 1 250 | පිරිවැය රු 200 000 වූ තොග රු 300 000 කට මුදලට විකිණීම |
| 04 | 10/01 | | පිරිවැය රු 300 000 වූ තොගයක් රු 400 000 කට තිලකාට ණයට විකිණීම |
| 05 | 12/01 | | පිරිවැය රු 800 000 වූ තොග ගංගා සමාගමෙන් ණයට ගැනීම |
| 06 | 12/01 | | පිරිවැය රු 600 000 වූ තොගයක් නාලක සමාගමට රු 560 000 කට ණයට විකිණීම |
| 07 | 15/01 | 3005 | තිලනාගෙන් ලැබිය යුතු මුළු මුදල ලැබී ඇත. |
| 08 | 18/01 | 500 | පිරිවැය රු 300 000 වූ තොගයෙන් රු 290 000 කට අත්පිට විකිණීම |
| 09 | 25/01 | 2002<br>2003 | වැටුප් ගෙවීම කුමාරි 100 000<br>නයනා 50 000 |
| 10 | 26/01 | 2004 | කාලච්ඡේදයේ කාර්යාල වියදම් රු 80 000 වූ අතර එයින් රු 60 000 පමණක් ගෙවීම |
| 11 | 29/01 | 601 | නාලක සමාගමෙන් ලැබිය යුතු මුළු මුදලින් රු 20 000 ක් අඩු කර ඉතිරි මුදල් ලැබීම |
| 12 | 30/1 | 2005 | ගංගා සමාගමට හිඟ ශේෂය නිරවුල් කරන ලදි. |

2018 ජනවාරි මාසයට අදාලව පහත බැංකු ප්‍රකාශණය 2018-02-03 දින ව්‍යාපාරයට ලැබුණි.

| දිනය | විස්තර | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 1/1 | මුදල් තැන්පතු | | 1 200 000 | 1 200 000 |
| 3/1 | චෙක් පත් අංක - 2001 | 600 000 | | 600 000 |
| 7/1 | චෙක් පත් අංක - 1250 | | 300 000 | 900 000 |
| 15/1 | චෙක් පත් අංක - 3005 | | 400 000 | 1 300 000 |
| 18/1 | චෙක් පත් අංක - 500 | | 240 000 | 1 540 000 |
| 25/1 | චෙක් පත් අංක - 2002 | 100 000 | | 1 140 000 |
| | චෙක් පත් අංක - 2003 | 50 000 | | 1 390 000 |
| 20/1 | චෙක් පත් අංක - 2004 | 60 000 | | 1 330 000 |
| | බැංකු ගාස්තු | 10 000 | | 1 320 000 |
| 31/1 | ශේෂය | | | 1 320 000 |

අවශ්‍යවන්නේ,

1. ඉහත අංක 01 සිට 12 දක්වා ගනුදෙනු පහත ආකෘතිය යටතේ පිළියෙල වන ගිණුම්කරණ සමීකරණයක ඉදිරිපත් කිරීම

| ගනුදෙනුව | වත්කම් | | | | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපල | තොග | වෙළඳ ලැබිය යුතු දෑ | මුදල් | වෙළඳ ගෙ. යුතු දෑ | වෙනත් ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධන | රඳවා ගත් ඉපයුම් |
| | | | | | | | | |

2. මුදල් ගෙවීම් ජනලය (2018 ජනවාරි මාසය සඳහා)
3. බැංකු සැසඳුම් ප්‍රකාශණය (බැංකු ප්‍රකාශණයේ ශේෂයෙන් ආරම්භක කර ) (විනාඩි 36 ලකුණු 20)

---

**(04)** අසේල ව්‍යාපාරයේ 2018-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය පහත දැක්වේ.

| ජංගම නොවන වත්කම් | පිරිවැය | ස.ක්ෂය | ධාරණ අගය |
|---|---|---|---|
| ගොඩනැගිලි | 500 000 | (75 000) | 425 000 |
| කාර්යාල උපකරණ | 100 000 | (20 000) | 80 000 |
| ස්ථාවර තැන්පතු | 120 000 | - | 120 000 |
| | | | 625 000 |
| **ජංගම වත්කම්** | | | |
| බඩුතොගය | | 50 000 | |
| වෙළඳ ලැබිය යුතු දෑ | | 80 000 | |
| ඉදිරියට ගෙවූ මෙහෙයුම් වියදම් | | 15 000 | |
| මුදල් | | 45 000 | 190 000 |
| | | | 815 000 |
| ප්‍රාග්ධණය | | | 400 000 |
| රඳවා ගත් ඉපයුම් | | | 86 000 |
| | | | 486 000 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය 15% | | | 200 000 |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත මෙහෙයුම් වියදම් | 29 000 | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | 100 000 | | 129 000 |
| | | | 815 000 |

**අමතර කරුණු**

01. ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමයට වාර්ෂික 5% ක්ෂය කරයි.
02. 2018-10-01 පිරිවැය රු 80 000 කාර්යාල උපකරණ ණයට ගත් අතර උපකරණ සරල මාර්ග ක්‍රමයට වාර්ෂික 10% ක් ක්ෂය කරයි. එම උපකරණ මුළු ණයට පියවීමට රු 90 000 ක් වර්ෂ අවසානයේ ගෙවා ඇත.
03. මුලු විකුණුම් රු 800 000 ක් එයින් 50% ණයට විකුණුම් වේ.
04. මුළු ගැනුම් රු 600 000 ක් වන අතර එයින් 60% ණයට ගැනුම් වේ.
05. 2019-03-31 දින ස්ථාවර තැන්පතුව කල් පිරුණු අතර එය කල් පිරිමේදී රු 132 000 ක් මුදලක් ලැබී ඇත.
06. බැංකු ණය පොළිය උපචිතව පවතී.

07. වර්ෂයේ අනෙකුත් මුදල් ලැබීම් හා ගෙවීම් පහත දක්වේ.

**මුදල් ලැබීම්**

| | |
|---|---|
| ණයගැතියන්ගෙන් ලද මුදල් (5% මුදල් වට්ටමකට යටත්ව) | 380 000 |
| ලද ගොඩනැගිලි කුලිය | 40 000 |

**මුදල් ගෙවීම්**

| | |
|---|---|
| ණයහිමියන්ට ගෙවීම් (10% මුදල් වට්ටමකට යටත්ව) | 270 000 |
| මෙහෙයුම් වියදම් | 90 000 |
| ගැනිලි | 50 000 |

08. දළ ලාභ අනුපාතිකය විකුණුම් මිලෙන් 40% කි.

**අවශ්‍යවන්නේ,**

1. ආදායම් ප්‍රකාශණය (2019-03-31 න් අවසන් වර්ෂය සඳහා)
2. 2019-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය

(විනාඩි 36 ලකුණු 20)

(05) සංදීප ක්‍රීඩා සමාජයේ 2019-03-31 න් අවසන් වර්සයට අදාලව සාරාංශ ගත මුදල් ගිණුම පහත දක්වේ.

**මුදල් ගිණුම**

| ලැබීම් | රු | ගෙවීම් | රු |
|---|---|---|---|
| 4/1 ශේෂය | 60 000 | ක්‍රීඩා පුහුණුකරුවන්ට | 50 000 |
| ලද සාමාජික මුදල් | 84 000 | ප්‍රවාහන ගාස්තු | 12 000 |
| ලද ඇතුලත් වීමේ ගාස්තුව | 16 000 | ක්‍රීඩා උපකරණ | 80 000 |
| ක්‍රීඩා උපකරණ ගැනීමට ලද පරිත්‍යාග මුදල | 80 000 | ක්‍රීඩා උපකරණ අලුත්වැඩියා | 8 000 |
| ක්‍රීඩාගාරය ඉදිකිරීමට එකතු වූ මුදල් | 90 000 | ක්‍රීඩා තරඟ වියදම් | 20 000 |
| | | 2018-10-01 ස්ථාවර තැන්පතුව මුදල් තැන්පත් කිරීම | 100 000 |
| | | ලිපි ද්‍රව්‍ය ගැණුම් | 10 000 |
| | | ශේෂය | 50 000 |
| | 330 000 | | 330 000 |
| ශේෂය | 50 000 | | |

**අමතර කරුණු**

01. **වත්කම් හා වගකීම්**

| | 2018-03-31 | 2019-03-31 |
|---|---|---|
| ක්‍රීඩා උපකරණ (ධාරණ අගය) | 150 000 | 220 000 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 8 000 | 23 000 |
| කලින් ලද සාමාජික මුදල් | 3 000 | 2 000 |
| ඉදිරියට ගෙවා ඇති පුහුණුකර වේතනය | 15 000 | 5 000 |
| ගෙවිය යුතු ප්‍රවාහන ගාස්තුව | 7 000 | 10 000 |
| ස්ථාවර තැන්පතුව | - | 100 000 |
| මුදල් | 60 000 | 50 000 |

02. වර්ෂය තුල ක්‍රීඩා උපකරණ ගැනීමට මුදල් පරිත්‍යාගයක් ලද අතර එම පරිත්‍යාගය වර්ෂ 4 ක් තුල සමානව ආදායමක් ලෙස හඳුනාගත යුතුය එම මුදල භාවිතා කර ක්‍රීඩා උපකරණ මිලදී ගෙන ඇත.

03. ක්‍රීඩාගාරයක් ඉදිකිරීමට සඳහා මුදල් එකතු කල අතර තවම ක්‍රීඩාගාරය ඉදිකර නැත.

04. ස්ථාවර තැන්පතුව සඳහා වාර්ෂික පොලිය 12% කි. මෙය තවම කාලපරිච්ඡේදයට අදාලව ගලපා ගත හැක.

05. වර්ෂ අවසානයේ ඉතිරි ලිපි ද්‍රව්‍ය තොගය රු 4 000 කි.

අවශ්‍යවන්නේ,

1. 2018-04-01 දිනට සමුච්චිත අරමුදල
2. 2019-03-31 න් අවසන් වර්ෂයට අදාලව ආදායම් ප්‍රකාශය (සංදීප ක්‍රීඩා සමාජයේ
3. 2019-03-31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය (විනාඩි 36 ලකුණු 20)

---

(06) ජනිත් හා මලිත් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ හවුල් ගිවිසුමේ කොන්දේසි පහත පරිදි විය.

- ලාභ අලාභ 3:2 අනුපාතයට බෙදා ගැනීමට
- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% පොළියක් ගෙවීමට
- ජනිත් හා මලිත්ට පිළිවෙළින් මසකට රු 6 000 සහ 3 000 බැගින් හවුල් වේතන ගෙවීමට
- අතිරේක ණය ශේෂ මත 10% පොළියක් ලැබීමට

2019-03-31 දිනට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත පරිදි විය.

| | හර (000) | බැර (000) |
|---|---|---|
| 2018-04-01 ප්‍රාග්ධන ගිණුම අමල් | | 5 000 |
| නිමල් | | 3 000 |
| 2018-04-01 ජංගම ගිණුම් අමල් | | 500 |
| නිමල් | 300 | |
| තරුෂ රැගෙන ආ මුදල | | 2 000 |
| ඉඩම (පිරිවැය) | 5 000 | |
| ගොඩනැගිලි (පිරිවැය) | 3 000 | |
| මෝටර් රථ (පිරිවැය) | 2 000 | |
| <u>2018-04-01 ක්ෂය වෙන් කිරීම</u> | | |
| ගොඩනැගිලි | | 600 |
| මෝටර් රථ | | 400 |
| විකුණුම් | | 6 000 |
| ගැණුම් | 2 500 | |
| 2018-04-01 තොගය | 500 | |
| විදුලිය | 600 | |
| දුරකථන | 200 | |
| වරිපනම් | 150 | |
| රක්ෂණය | 50 | |
| වෙළඳ ලැබිය යුතු / වෙළඳ ගෙවිය යුතු | 1 000 | 500 |
| ණය ගිණුම - ජනිත් | | 500 |
| ණය පොළී - ජනිත් | 50 | |
| ගැනිලි | 300 | |
| හවුල් වේතන - මලිත් | 20 | |
| ප්‍රාග්ධන පොලි - ජනිත් | 50 | |
| මුදල් | 2 780 | |
| | 18 500 | 18 500 |

**පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.**

1. 2019-03-31 දිනට ඉතිරි තොගයේ පිරිවැය 250 000 වූ අතර එදිනට එහි ශුද්ධ උපලබ්ධි අගය රු 240 000 විය.
2. ව්‍යාපාරය තම දේපල පිරියත උපකරණ පිරිවැය මත වාර්ෂිකව පහත අනුපාතයන් යටතේ ක්ෂය කරයි.

   ගොඩනැගිලි 10%

   මෝටර් රථ 20%
3. 2019-03-31 දින තරුෂ නව හවුල්කරුවෙකු ලෙස ව්‍යාරයට බැදුනා අතර එදිනට ව්‍යාපාරයේ මුළු කීර්තිනාමය රු 1 000 000 ලෙස ඇස්තමේන්තු කරන ලදි. තවද තරුෂගේ පැමිණීමෙන් පසු හවුල් ව්‍යාපාරයේ කොන්දේසි පහත පරිදි වෙනස් කරන ලදි.

- ලාභඅලාභ ජනිත් මලිත් හා තරුෂ අතර 5:3:2 අනුපාතයට බෙදා ගැනීමට
- ප්‍රාග්ධන පොළී හා හවුල් වේතනවා නොගෙවීමට

4. හවුල්කරුවන් පහත පරිදි ගැනිලි සිදුකර ඇත.

| | |
|---|---|
| ජනිත් | 240 000 |
| මලිත් | 60 000 |

අවශ්‍යවන්නේ,

1. හවුල් ව්‍යාපාරයේ 2019-03-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශණය (විසර්ජනයද සහිතව)
2. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන/ජංගම ගිණුම්
3. මූල්‍ය තත්ත්ව ප්‍රකාශණය (විනාඩි 36 ලකුණු 20)